රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 03/2025 (II)

මගේ අංකය : Pns/P4/W&OP/F11
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2026.07.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන් / පොලිස්පති
ප්‍රාදේශීය ලේකම්වරුන්
පළාත් පාලන ආයතන ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධරයන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය, නව මාර්ගගත තොරතුරු පද්ධතියක් ඔස්සේ සිදු කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.01.20 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 සහ 2025.11.17 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 (I) කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව හඳුන්වාදෙනු ලැබූ නව මාර්ගගත තොරතුරු පද්ධතිය ඔස්සේ ලියාපදිංචිය, තොරතුරු යාවත්කාලීන කිරීම සහ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය කිරීමේ කටයුතු සඳහා ලබා දී තිබූ කාල සීමාව 2026.02.28 දිනෙන් අවසන් වූ බැවින් ඉහත තොරතුරු පද්ධතියේ එකී කටයුතු සඳහා ලබා දී තිබූ පහසුකම එදින සිට අවුරා තබා ඇත.

03. එසේ වුව ද, 2026.02.28 දිනට පෙර එම කටයුතු අවසන් කිරීමට නොහැකි වූ රාජ්‍ය ආයතන වෙතින් ලැබී ඇති ඉල්ලීම් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරමින් පවතින ඒකාබද්ධ විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය (Integrated Pensions Management System –iPMS) මගින් ඉදිරියේ දී සපයනු ලබන සේවාවන් සඳහා පාදක කරගන්නා වූ මූලික දත්ත පද්ධතිය ලෙස වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් සාමාජිකත්වය හිමිගැන්වීමේ මෙම පද්ධතිය ක්‍රියාත්මක වන බැවින් සියලුම රාජ්‍ය නිලධරයන් දත්ත පද්ධතියට ඇතුළත් කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සලකා බලා ඉහත මාර්ගගත තොරතුරු පද්ධතිය 2026.10.30 දින දක්වා නැවත සක්‍රීය කර ඇත.

04. එහෙයින්, දත්ත පද්ධතියෙහි ලියාපදිංචි වීම, තොරතුරු යාවත්කාලීන කිරීම සහ ප්‍රතිලාභීන්ගේ තොරතුරු සත්‍යාපනය කිරීම යන සියලුම කටයුතු 2026.10.30 දින වන විට සිදු කර අවසන් කළ යුතු ය.

05. දත්ත පද්ධතිය වෙත දෝෂ සහිත දත්ත ඇතුළත් කර ඇති අවස්ථා පවතින බව නිරීක්ෂණය වී ඇති බැවින් මීට අදාළ චක්‍රලේඛ පිළිබඳව කාර්ය මණ්ඩල මනාව දැනුම්වත් කිරීමටත් පද්ධතිය වෙත ඇතුළත් කරනු ලබන දත්තවල නිරවද්‍යතාවය පසු විපරම් කිරීමටත් හැකි වන ආකාරයේ සුදුසු අධීක්ෂණ වැඩපිළිවෙලක් ඇති කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

06. ඉහත 03 සහ 04 ඡේද යටතේ සඳහන් සංශෝධන හැර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2025 (I)හි අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතී.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

**පිටපත් :**

1. ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු.දැ.ගැ.ස
3. ලේකම්, මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
4. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
5. ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
6. විගණකාධිපති - කරු.දැ.ගැ.ස